කොළඹ විශ්ව විද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2018

දෙවන සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය

**ECN 2220: මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ආර්ථික විද්‍යාව**

කාලය - පැ දෙකයි (02)

**ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.**

---

1.

I. රටක මානව ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රධාන මූලාශ්‍ර මොනවාද? අවශ්‍ය තැන්හී උදාහරණ දෙමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 12)

II. "මානව ප්‍රාග්ධනය", රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි බලපාන වැදගත්ම සාධකය ලෙස ඔබ සිතන්නේ මන්ද? ඔබේ පිළිතුර උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 13)

2.

I. මානව සම්පත් සැලසුම්කරණයේ ස්වභාවය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

II. මානව සම්පත් ඉල්ලුම පුරෝකථනය කිරීම සඳහා භාවිතා කළ හැකි ශිල්පීය ක්‍රම විභාග කරන්න. (ලකුණු 12)

III. සේවාදායක අතිරික්තයකදී හා සේවාදායක හිඟයකදී ආයතනයකට ගත හැකි විවිධ උපාය මාර්ග මොනවාද යන්න තාර්කිකව විභාග කරන්න. (ලකුණු 09)

3.

I. සංවිධානයක අභ්‍යන්තර හා බාහිර ආකර්ෂණ ක්‍රමවේදයන් (Recruitment Methods) මොනවාද? එක් එක් ක්‍රමවේදයන්හි ඇති වාසි අවාසි විස්තර කරන්න. (ලකුණු 17)

II. ආකර්ෂණය (Recruitment), තෝරා ගැනීම (Selection) හා බඳවා ගැනීම (Hiring) යන සංකල්ප අතර වෙනස විභාග කරන්න. (ලකුණු 08)

4.

I. සේවකයින් තෝරා ගැනීම සාර්ථක කර ගැනීම සඳහා බලපාන යෙදවුම් (Inputs) හා අවශ්‍යතා (Requirements) මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 08)

II. සේවකයන් තෝරා ගැනීමේ විවිධ ක්‍රමවේද හා වඩාත් හොඳම අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා එම ක්‍රමවේදයන්හි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 17)

5. ඔබ ABC සමාගමෙහි මානව සම්පත් කළමනාකරු බව හා කිසියම් සේවාදායක කණ්ඩායමක් වෙනුවෙන් අනුස්ථාපන වැඩසටහනක් සැකසීමට, පැවැත්වීමට හා ඇගයීමට ඔබට ඉල්ලීමක් කර ඇතැයි සිතන්න. මේ සම්බන්ධයෙන් ඔබ ක්‍රියා කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 25)

6.

I. මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ආකෘතිය ඇඳ එහි ඇතුළත් මානව සම්පත් කළමනාකරණ කාර්යයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

II. මානව සම්පත් කළමනාකරණයේ (a) මූලික පරමාර්ථය (b) උපක්‍රමික පරමාර්ථ සහ (c) අරමුණු මොනවාද යන්න විස්තර කරන්න. (ලකුණු 10)

7.

එක්කෝ

I. "ඵලදායි සහ තෘප්තකර රැකියාවක් නිර්මාණය කළ හැක්කේ කාර්යක්ෂම මූලිකාංග (Efficiency Elements) හා චර්යා මූලිකාංග (Behavioral Elements) අතර තුලනයක් ඇති කර ගැනීමෙනි". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුර උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 25)

හෝ

II. "රැකියා විශ්ලේෂණය පියවර මාලාවකින් ඉටු කළ යුතු ක්‍රියාවලියක් ලෙස දැක්විය හැකිය". ඔබ කිසියම් සංවිධානයක රැකියා විශ්ලේෂක ලෙස පත් කර තිබේ නම් රැකියා විශ්ලේෂණ ක්‍රියාවලිය සිදු කරන ආකාරය ක්‍රමානුකූලව විස්තර කරන්න. (ලකුණු 25)